# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
## ඒකක පරීක්ෂණය

| 11 ශ්‍රේණිය | නර්තනය | 5.2 ඒකකය |
|---|---|---|

කාලය : පැය 01

## පර්යේෂණාත්මක ලේඛන/කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කරමු.

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

01. නර්තන විෂය හා සබැඳි ලිඛිත ග්‍රන්ථ රචනය ආරම්භ වී ඇත්තේ,
(1). 18 වන ශතවර්ෂයේ සිටය. (3). 20 වන ශතවර්ෂයේ සිටය.
(2). 19 වන ශතවර්ෂයේ සිටය. (4). 21 වන ශතවර්ෂයේ සිටය.

02. නර්තන ක්ෂේත්‍රයේ මහාචාර්ය පදවියක් ලබාගත් ප්‍රථම ලාංකිකයා වන්නේ,
(1). ජයසේන කෝට්ටේගොඩ මහතා ය (3). සනත් නන්දසිරි මහතා ය
(2). තිස්ස කාරියවසම් මහතා ය (4). මුදියන්සේ දිසානායක මහතා ය

03. ''සිංහල නර්තන කලාව'' කෘතිය පළ කරන ලද්දේ,
(1). 1996 වර්ෂයේ දී ය. (3). 1998 වර්ෂයේ දී ය.
(2). 1997 වර්ෂයේ දී ය. (4). 1999 වර්ෂයේ දී ය.

04. සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති මහාචාර්ය,
(1). තිස්ස කාරියවසම් ය (3). සනත් නන්දසිරි ය
(2). ඒ. ජේ. ගුණවර්ධන ය. (4). ජයසේන කෝට්ටේගොඩ ය

05. ''රට යකුම'' යනු පහතරට නර්තන සම්ප්‍රදායට අයත්
(1). ශාන්තිකර්මයකි (2). නර්තනාංගයකි (3). පූජා විදියකි. (4). චාරිත්‍රය කි.

(ලකුණු 2 × 5 = 10)

- **සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.**

01. භරත, කථක්, ......................................, මණිපුරි යනු භාරතීය නර්තන සම්ප්‍රදායන් ය.
02. රිද්දියාගයට සමානාර්ථ පදයකි, ..............................................
03. තිස්ස කාරියවසම් මහතා ..................................................... විෂයානුබද්ධව මහාචාර්ය ධූරයක් දැරුවෙකි.
04. වර්ෂ 2000 දී එළි දැක්වූ ''සබරගමු නර්තන කලාව'' ආචාර්ය ........................................................ විසින් රචනා කරන ලදී.
05. කොහොඹා කංකාරි ශාන්තිකර්මයට ආවේණික සියලු තොරතුරු ඇතුළත් ග්‍රන්ථය ................................ යි.

(ලකුණු 2 × 5 = 10)

- **කෙටි පිළිතුරු සපයන්න.**

01. මහාචාර්ය මුදියන්සේ දිසානායක විසින් රචිත කෘති දෙකක් සඳහන් කරන්න.
02. වර්ෂ 1998 දී පළ කරන ලද නර්තන කලාව හා සම්බන්ධ කෘති දෙකක් නම් කරන්න.
03. ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ විසින් රචිත කෘති දෙකක් සඳහන් කරන්න.
04. නර්තන කලාව හා බැඳි ශාන්තිකර්ම පිළිබඳ ලියන ලද කෘතිය කුමක්ද? එය ලියා පළ කරන ලද්දේ කවුරුන් විසින්ද?
05. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්ම තුනක් නම් කරන්න.

(ලකුණු 6 × 5 = 30)

*සැකසුම : අමිලා ජීවනී*